වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2019

வருடாந்த மதிப்பீட்டு அறிக்கை - 2019

Annual Performance Report - 2019

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව

மாவட்ட செயலகம் - வவுனியா

District Secretariat - Vavuniya

2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව

වැය ශීර්ෂ අංකය - 266

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01. පරිච්ඡෙදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම

සීමාවන් - මෙම දිස්ත්‍රික්කය නැගෙනහිරින් අනුරාධපුර දිස්ත්‍රික්කයට ද, මුලතිව් දිස්ත්‍රික්කයට ද, උතුරෙන් මුලතිව් දිස්ත්‍රික්කයට ද, බටහිරින් මන්නාරම දිස්ත්‍රික්කයට ද, මුලතිව් දිස්ත්‍රික්කයේ කොටසකටද, දකුණෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ද සීමා වී ඇත. ප්‍රසිද්ධ A9 මාර්ගය ,කොළඹ කොටුවේ සිට කන්කසන්තුරේ දක්වා දිවෙන දුම්රිය මාර්ගයෙන් ද කොළඹ කොටුව සිට තලෙලෙමන්නාරම් දක්වා දිවෙන දුම්රිය මාර්ගයද මෙම දිස්ත්‍රික්කය හරහා පිහිටා ඇත. කනකරායන් කුලම් ආරු, පාලි ගඟ,පරංගි ගඟ,යන ප්‍රධාන ගංඟාවන් ද වෙනත් අතු ගංඟාවන් ද මෙම දිස්ත්‍රික්කය හරහා ගලා බසී.

ඓතිහාසික වැදගත්කම

වන්නි ප්‍රදේශයේ පිහිටි ගම්මාන සියල්ල වැව්වල නමින් නිර්මාණය වී තිබීම විශේෂත්වයකි. මෙම ප්‍රදේශයේ නාග ගෝත්‍රික යුගයේ විවිධ වූ ගංගාවන් හරස් කර වැව් ඉදි කරනු ලැබිණ. වැසි සමයේ කඳුකර ප්‍රදේශයන්හි ගලා බසින ජලය සමාන්තර භූමි ප්‍රදේශයන්හි ජලය එක් රැස් කර කෘෂිකාර්මික කටයුතු වල නිරත වීමට වැව් ඉදි කරනු ලැබිණ. ඈත පුරාතන යුගයේ මෙම ප්‍රදේශය කුඹුරු යායක් ලෙසද විශාල ගොවිපළ වශයෙන් ද බෙදා වෙන් කළ බවට ඉතිහාසය සාක්ෂි දරයි.

දැනට වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් සුළු හා මධ්‍ය පරිමාණයේ වැව් 719 ක් පමණ තිබේ. මෙම දිස්ත්‍රික්කයේ විශාලතම වාරිමාර්ග යෝජනා ක්‍රමය ලෙස පාවට්කුලම් හැඳින්විය හැක. මෙම වැව ඊරට්පෙරිය කුලම් හරහා දිවෙන කල්ලාරු හරස් කර ඉදි කළ වාරි යෝජනා ක්‍රමයකි. මෙම වැවෙන් පිටාර ගලන ජල පෝෂිත ප්‍රදේශයේ විශාල, කුඩා වැව් ප්‍රමාණයන්ද පවතී. මදවු වෛත්ත කුලම්, සින්න තම්පනෙයි යන ප්‍රදේශයන්හි පෙන පහක් සහිත නාගයාගේ රූප දක්නට ලැබීම මෙම වැව් නාග ගෝත්‍රිකයින්ගේ කාල වකවානුවට අයත් බවට සාක්ෂියකි.

කිලක්කු මූලෛ ප්‍රදේශයේ මඩුකන්ද, සමලන්කුලම් ආදී ස්ථාන වල පවතින කඳු ආශ්‍රිත ප්‍රදේශයේ වැසි සමයේදී ගලා බසින ජලය රඳවා තබා විවිධ ස්ථාන වල වැව් ඉදි කර තිබිණ. මඩුකන්ද ප්‍රදේශයේ සිට උතුර බලා ගලා බසින ජලය රඳවා තබා ගැනීම සඳහා වැව් ඉදි කෙරිණ. මෙම වැව විලාංකුලම් නමින් හැඳින්වේ.

ක්‍රි.පූ.1750 හිදී සිදුවූ ගංවතුර හේතුවෙන් වැව් ගණනාවක් කැඩී යාමට ලක්විය. ඊට විලාංකුලම් ද ඇතුළත් වේ. මෙම වැව ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ප්‍රදේශවාසීන් පනංකාම රාජධානියේ වවුනියන් වශයෙන් තනතුරු හෙබවූ අය වෙත පැමිණිලි කර ඇත. ඔහු මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් මෙයට ‘වවුනියන් විලන්කුලම්‘ යන නම නිර්මාණය විය.

ක්‍රි.පූ.1980 දී වවුනියන් විලන්කුලම් හි සේවය කළ J.P. ලුයිස් නම් වූ නිලධාරියා ‘වවුනියන් විලන්කුලම්‘ යන නාමය කෙටියෙන් “වවුනියා“ ලෙස නම් කළ බව ඔහු ලියූ වන්නි අත්පොතේ සඳහන් කර ඇත.

රාවණ මහ රජුගේ ලංකාපුරම් රාජධානිය මාන්තෛ මාන්තෝට්ටම් ප්‍රදේශයේ පිහිටා තිබිණ. රාවණ මහ රජ යුද්ධයෙන් පරාජයට පත් වීමෙන් පසු ඔහුගේ ආධාරකරුවන් වන යක්ෂ, නාග ගෝත්‍රිකයින් ලංකාපුරයෙන් නැගෙනහිර දිශාව බලා පිටත්ව ගියහ. ඔවුන් පදිංචි ප්‍රදේශය මුල්ල වශයෙන් බෙදා නැගෙනහිර දිශාව, බටහිර දිශාව යනුවෙන් නම් කෙරිණ.

පෘතුගීසින්ගේ පාලන සමයේදී දේවස්ථාන සඳහා එම ප්‍රදේශ කෝරලේ වශයෙන් බෙදා වෙන් කළද එම ක්‍රම වේදය ක්‍රියාත්මක කිරීමට ඔවුනට හැකියාව නොලැබිණ. පසුව ලන්දේසි අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ 1783 දී වන්නි ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ පාලනය යටතට ගැනුනද කෝරලේ යනුවෙන් කොට්ඨාශ හඳුන්වා දී තිබිණ. ලන්දේසින්ගේ ආරම්භක යුගයේ මුලතිව් ප්‍රදේශයේ කොටුවක් ඉදි කළ බැවින් මුළු ප්‍රදේශයම පරිපාලන දිස්ත්‍රික්ක ලෙස පැවතිණ.

මීට පෙර මුල්ල වශයෙන් කොටස් කළ ප්‍රදේශයන්ද කෝරලේ වශයෙන් කොටස් කළ ප්‍රදේශයන්ද නැගෙනහිර දිශාව හා සම්බන්ධ කිරීම මෙයින් ගම්‍ය වේ. තවද තිරුකේතීශ්වරම් කෝවිල් කොට්ඨාශයක් ලෙස පිහිටි උඩෙයාවූර් යන කොටස කිලක්කු මුල්ල සමග සම්බන්ධ කෙරිණ. 1795 දී ඉංග්‍රීසි පාලන සමයේදී වවුනියාන් විලන්කුලම් තනි කොට්ඨාශ ලෙස කොටස් වශයෙන් බෙදා යම් වෙනස්කම් සිදු කෙරිණ.

1890 වර්ෂ වල නාම වෙනස් කිරීමෙන් පසු වවුනියා තනි දිස්ත්‍රික්කයක් බවට පත්විය. ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් අනතුරුව මැතිවරණ දිස්ත්‍රික්ක කොටස් කෙරිණ. මැතිවරණ දිස්ත්‍රික්ක සලකුණු කිරීමේදී කිලක්කුමූලෙ, ඉහළ කෝරලේ උතුරු කොට්ඨාශය, උඩයාවූර් ආදී ප්‍රදේශ යාකොට තනි පරිපාලන දිස්ත්රික්කයක් වශයෙන් නිර්මාණය වී තිබීම ඉතිහාසයෙන් පැහැදිළි වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වවුනියාව

දැක්ම

- විශිෂ්ඨ සේවාවක් සැපයීම තුළින් වවුනියා දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම.

මෙහෙවර

- භෞතික සම්පත් ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කර ගනිමින් තිරසාර සංවර්ධනයක් උදෙසා, දිස්ත්‍රික්කයේ මානව සම්පත නිවැරදිව මෙහෙයවීම තුළින් යහපාලනය සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම.

අරමුණු

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධානතම ඉලක්කය වන්නේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ යහපත වෙනුවෙන් නීතිමය විධිවිධානයන් මගින්, නියෝග මගින් නිර්දේශිත සුදුසු තීරණයන් හා වැඩසටහන් විවිධ වූ සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම, අධීක්ෂණය කිරිම හා සම්බන්ධීකරණය කිරීම වේ.

1.3. ප්‍රධාන කාර්යයන්

ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ක්‍රියාකාරකම්

- ග්‍රාමීය,ප්‍රාදේශීය දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් ආයතන මගින් රජයෙන්ගනු ලබන පියවර නිතීමය රාමුව තුළ ක්‍රියාවන් ඉටුකිරීම් සම්බන්ධීකරණය කිරීම.
- වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථාපිත මණ්ඩලවල නියෝජිතයෙකු ලෙස කටයුතු කිරිම.
- ආදායම් බදු එකතු කිරීම.
- මුල්‍ය කළමණාකරණය ගිණුම් ගත කිරීම.
- විමධ්‍යගත අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විවිධ විදේශ මුල්‍යාධාර මත වන වැඩසටහන් අධීක්ෂණය කිරීම සහ පිළිගත් සංවර්ධන ප්‍රතිපත්තීන් මගපෙන්වීම ලබා දීම.
- පළාත් සභා කටයුතු වලට සහයෝගය ලබා දීම.

A දිස්ත්‍රික්කයේ පරිපාලන ක්‍රියාවන්

I. සුහද සම්බන්ධතාවය පවත්වාගෙන යාම තුළින් දිස්ත්‍රික්කය තුළ දෙපාර්තමේන්තු සහ සංස්ථාපිත මණ්ඩල වල කටයුතු විධිමත්ව සම්බන්ධීකරණය කිරීම.

II. මහජනතාවට වඩාත් ඵලදායී සේවාවක් ලබා දීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය හා ග්‍රාම නිලධාරීන් විධිමත්ව අධීක්ෂණයට ලක් කිරීම.

III. රජයේ තීරණයන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අතර ප්‍රදේශය යථාතත්ත්වයන්ට ගෙන ඒමට සහය දැක්වීම.

IV. මහජනයාට අවශ්‍ය වේලාවට සේවාව ලබා දීම සහතික කිරීම වස් පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරවීම.

B. නියෝජිත ක්‍රියාවන්

I. මහජනයා තමන්ට අවශ්‍ය සේවාව බාධාවක් හෝප්‍රමාදයකින් තොරව වඩාත් කාර්යක්ෂම හා ක්‍රියාශීලීව ලබා ගැනීමට හැකි වන සේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලට බාර දී ඇති ක්‍රියාදාමයන් ඉටු කර දීම.

II. ප්‍රමාදයන් හා බාධාවන් නොවන ආකාරයට තෘප්තිමත් සේවාව මහජනයාට ලබා දිය හැකි වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට සියළු ක්‍රමෝපායන් මගින් මාර්ගෝපදේශය ලබා දීම.

III. ප්‍රමාද දෝෂයන් ව්‍යාකූලතාවන් මග හරවා ගැනීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහා ආයතන අතර යහපත් සම්බන්ධීකරණය හා සුහද සම්බන්ධතාව සහතික කර ගැනීම.

IV. ක්‍රමවත් ප්‍රශ්න නිරාකරණ යාන්ත්‍රණයක් මගින් දිස්ත්‍රික්කයේ මහ ජනතාවගේ වාසී ජනතාවගේ ගැටළු වලට කඩිනම් විසඳුම් ලබා දීම.

C. සම්බන්ධීකරණ ක්‍රියාවලිය

1. පහත දක්වා ඇති සම්බන්ධීකරණ කමිටු වල රැස්වීම් සෑම මාසයකම පවත්වා සාකච්ඡා කිරීමටත්, තීරණයක් ගැනීමටත් අවශ්‍ය පහසුකම් ලබා දීම
   - දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව
   - දිස්ත්‍රික් සැලසුම් කමිටුව
   - දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව
   - දිස්ත්‍රික් මිල නිර්ණය කමිටුව
   - දිස්ත්‍රික් නිවාස ඉදිකිරීම් කමිටුව
   - දිස්ත්‍රික් ළමා රක්ෂණ කමිටුව
   - ජල සැපයීම් සහා සෞඛ්‍ය සේවා කමිටුව
   - දිස්ත්‍රික් පරිසර නීති බලාත්මක කිරීමේ කමිටුව
   - දිස්ත්‍රික් ආරක්ෂක කමිටුව
   - දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව
   - දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව

2. දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන මහජනතාවට බේදයකින් තොරව මානව හිතවාදී සේවාවන් ඉටුකිරීමට ඔවුන්ගේ ක්‍රියාදාමයන් කෙරෙහි සම්බන්ධීකරණය ලබා දීම.

1.4. සංවිධාන සටහන



1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවේ/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

ජනගහනය හා ප්‍රධාන ජීවනෝපාය මාර්ග

ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල වාර්තාවන්ට අනුව මෙම දිස්ත්‍රික්කයේ ජනගහනය 31.12.2019 දිනට 184,444ක් වේ. පවුල් 47,292 ඇතුලත් වේ. නගරාසන්න ප්‍රදේශයන්හි 37,310 දෙනෙක් ද ගම්මානවල 147,134 දෙනෙක් ද ජිවත් වේ. දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 83.78%ක් දමිළ ජනතාවද 9.72%ක් සිංහල ජනතාවද 6.5%ක් මුස්ලිම් ජනතාවද ජිවත් වෙයි.

කෘෂිකර්මාන්තය "කුඩා පරිමාණ කර්මාන්තයන් වන පශු සම්පත්, සත්ත්ව පාලනය" වෙළදාම මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයන් වේ. රාජ්‍ය සේවයෙහි නිලධාරින් මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි කරුවන් වේ. විවිධ වර්ගයේ මුල්‍යායතන වල ක්‍රියා කලාපයන් මෙම දිස්ත්‍රික්කයේ ඉතා විශිෂ්ඨ අන්දමින් පවත්වාගෙන යයි.

පෞද්ගලික අංශයේ ආයතන සහ රාජ්‍ය නොවන ආයතන මෙම දිස්ත්‍රික්කයේ ජනයාගේ ජීවනෝපාය මාර්ගයන්හට විශාල දායකත්වයක් දක්වයි. ඒ නමුත් පසුගිය කාලයේ ඇතිවු අභ්‍යන්තර ආරවුල් හේතුවෙන් මෙම දිස්ත්‍රික්කයේ ජනතාව තැන තැන විසිර ජීවත් වෙති. එපමණක් නොව විශාල වශයෙන් උගත් තරුණ තරුණියන් විරැකියාවෙන් පීඩාවට පත්ව ඇත

පිහිටීම සම්බන්ධ තාරතුරු

- පළාත - උතුරු පළාත
- පරිපාලන දිස්ත්‍රික්කයේ - වවුන්යාව
- මුළුභූමි ප්‍රමාණය - 1967වර්ග කි.මී
- ප්‍රාදේශිය ලේකම්කොට්ඨාශ - 04 (හතරයි)
- ග්‍රාම.සේවා වසම්වල සංඛ්‍යාව - 102
- ගම්මානවල සංඛ්‍යාවන් - 512

31.12.2019 දිනට දිස්ත්‍රික්කයේ පිළිබඳ වු මුලික තොරතුරු

විස්තර	ප්‍රා.ලේ වවුනියාව	ප්‍රා.ලේ වවුනියා උතුර	ප්‍රා.ලේ වවුනියා දකුණ	ප්‍රා.ලේ වෙංගල සෙට්ටිකුලම	වවුනියා දිස්ත්‍රික්කයේ මුළු ගණන
ග්‍රාම සේවා වසම් වල සංඛ්‍යාව	42	20	20	20	102
ගම්මාන සංඛ්‍යාව	218	110	91	93	512
පවුල් සංඛ්‍යාව	32,295	3,181	3,604	8,212	47,292
සාමාජික සංඛ්‍යාව	125,952	12,407	14,058	32,027	184,444
පිරිමි සංඛ්‍යාව	61,275	6,416	6,910	16,182	90,783
ගැහැණු සංඛ්‍යාව	64,678	5,991	7,148	15,844	93,661
සංඛ්‍යාව ප්‍රමාණය ඉඩම් (වර්ග කි.මි)	590	746	236	395	1,967

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

වවුනියා පරිපාලන දිස්ත්‍රික්කයේ සංවර්ධනය අරමුණු කොට ගෙන පසුගිය වර්ෂයේ (2019) විවිධ සංවර්ධන වැඩසටහන් දියත් කෙරිණ. එනම් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය ජීවනාධාර දීමනා, පොදු පහසුකම්, යටිතල පහසුකම්, ග්‍රාමීය සමාජ රජයේ දිළිඳුකම පිටු දැකීම, නැවත පදිංචි කිරීම, මාර්ග ප්‍රවාහන සංවර්ධනය, පාසල් ක්ෂේත්‍රයේ සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය ආගමික සිද්ධස්ථාන සංවර්ධනය හා කුඩා ව්‍යාපාර ණය යෝජනා ක්‍රම යනාදි විවිධ ක්ෂේත්‍රයන්හි සිදු විය.

2019 වර්ෂයේ ගම් පෙරලිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් යටතේ ව්‍යාපෘති 830 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 408.25 මුදල් ප්‍රතිපාදන ලැබිණ. මෙම ව්‍යාපෘති දිස්ත්‍රික්කය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ල අන්තර්ගත වන අයුරින් ව්‍යාපෘති 221 ක් සාර්ථකව දියත් කළ අතර ව්‍යාපෘති 09 ක් දැනට අවසන් අධියරට පැමිණ ඇත.

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම් පුනරුත්ථාපන හා උතුරු පළාත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ පානීය ජල ව්‍යාපෘති 110 ක් රු.මිලියන 12.8ක් වියදමින් ද නිවාස ව්‍යාපෘති යටතේ අධියර 01 හි ව්‍යාපෘති 450 ක් ද රු.මිලියන 450 ප්‍රතිපාදනයෙන්ද අධියර 02හි ව්‍යාපෘති 550ක් සඳහා රු.මිලියන 550ක් ද අධියර 03 හි ව්‍යාපෘති 25ක් රු.මිලියන 25ක වියදමෙන් ක්‍රියාත්මක කර ඇත.

දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයෙන් වි වේලන කමත්, වගා ප්‍රතිසංස්කරණ වී මිලදී ගැනීම්, පැළ වර්ග බෙදා දීම, හරිත සමාජ බිහි කිරීම ආදී කටයුතු රු.මිලියන 4.3 ක වියදමෙන් සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි.

දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයෙන් දිස්ත්‍රික්කයේ අධි සාර්ථකව දියත් කළ ග්‍රාමීය මට්ටමේ ව්‍යවසායකයන් හට රු මිලියන 28ක ප්‍රතිපාදන ලැබී ඇති අතර තෝරා ගත් ව්‍යවසායකයන් හට රු මිලියන 08ක ණය පහසුකම් ලබා දීමට හැකියාව ලැබී ඇත.

මෙම වර්ශයේ දියත් කළ විශේෂ ව්‍යාපෘති කඩිනමින් සිදුකිරීමේ දී දැඩි වර්ෂාව හා මුදල් ප්‍රතිපාදන ප්‍රමාණාත්මකව නොලැබීම ආදි අභියෝග ලෙසට සඳහන් කළ හැකිය.

මෙම වර්ශයේ දියත් කළ උක්ත කාර්යයන් මගින් දිස්ත්‍රික්කයේ මහජනතාවගේ ජීවනෝපාය තත්වයන් ඉහළ ගොස් තිබීම නිරීක්ෂණය වන අතර මෙම කරුණු විදහා දක්වන අයුරින් 2019 වර්ෂය සඳහා වන සංඛ්‍යාත්මක දත්ත ඇතුලත් වාර්ෂික කාර්ය සාධන වාර්ථාව ලේඛණ ගතව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වවුනියා පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති වශයෙන් මා සතුටට පත්වෙමි.

තවද කොවිඩ් 19 වසංගතයෙන් පීඩා විඳින අසාමාන්‍ය වාතාවරණය තුලදි වුවද මෙම විශාල කර්තව්‍යන් සාර්ථක කර ගැනීමට කැපවීමෙන් වැඩ කළ නිලධාරීන්ට හටද මාගේ ස්තූතිය පිරිනමමි.

එස්.එම්.සමන් බන්දුලසේන
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
වවුනියා

එස්.එම්.සමන් බන්දුලසේන
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
වවුනියාව

03.පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

31.12.2019 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2019	2018	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		2,639,782,000	1,741,191,613	ඒසීඒ-3
-	තැන්පතු		298,359,834	236,237,783	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම		11,412,367	15,981,003	ඒසීඒ-5/5(ඒ)
-	වෙනත් ලැබීම		85,074,479	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**3,034,628,680**	**1,993,410,399**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**3,034,628,680**	**1,993,410,399**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
179,125,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	178,498,666	156,037,517	
48,705,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	46,495,846	45,575,654	ඒසීඒ-2(ii)
1,470,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම	7	1,246,136	1,282,198	
-	පොළී ගෙවීම	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම	9	-	-	
229,300,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**226,240,648**	**202,895,369**	
	මූලධන වියදම්				
18,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	13,271,036	16,812,804	
34,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	21,610,069	52,999,580	
-	ප්‍රාග්ධන මාරුකිරීම	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,900,000	හැකියා වර්ධනය	14	1,899,412	1,797,774	
1,350,000	වෙනත් මූලධන වියදම	15	1,348,860	-	
55,350,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**38,129,376**	**71,610,158**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**265,579,716**	**280,528,635**	
	තැන්පතු ගෙවීම්		249,642,412	259,672,832	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		15,937,304	20,855,803	ඒසීඒ-5/5(ඒ)
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		**529,949,740**	**555,034,162**	
284,650,000	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**2,504,678,940**	**1,438,376,237**	

3.3. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

31.12.2019 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	සත්‍ය 2019	2018
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,579,055,053	1,533,908,436
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	48,216,868	45,457,146
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**1,627,271,921**	**1,579,365,582**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		(63,247,362)	(17,289,662)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,579,055,053	1,533,908,436
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	111,464,230	62,746,808
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**1,627,271,921**	**1,579,365,582**

පිටු අංක 05 සිට 42 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 43 සිට 51 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 20.02.2020
දිනය : 26/2/2020	දිනය : 22/02/2020	
එස්. හෙට්ටිආරච්චි ලේකම් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය "නිල මැදුර" ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.	එස්.එම්.සමන් බන්දුලසේන දිස්ත්‍රික් ලේකම්/දිසාපති වවුනියාව	ඒ.බාලකුමාර් ප්‍රධාන ගණකාධිකාරි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වවුනියාව

3.4. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

31.12.2019 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තතාය	
	2019 රු.	**2018** රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	1,989,725,123
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	65,965,947	
අග්‍රිම ලැබීම්	2,639,782,000	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,705,747,947**	**1,989,725,123**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	202,474,568	820,537,740
සහනාධාර සහ මාරුකිරීම්	1,246,136	1,282,198
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,427,516,116	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,631,236,820**	**821,819,938**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**74,511,127**	**1,167,905,185**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	15,995,779	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**15,995,779**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	37,080,351	1,167,905,185
අත්තිකාරම් ගෙවීම්	22,394,413	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඈ)	**59,474,764**	**1,167,905,185**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඈ)	**(43,478,985)**	**(1,167,905,185)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**31,032,142**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	263,191,066	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**263,191,066**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	232,158,923	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**232,158,923**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**31,032,142**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ)	**0**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන්

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරන කාලපරිච්ඡේදය වේ.

2.මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයේන් දක්වා නොමති විට ගිණුම් පිළියෙල කිරිම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැතිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරන ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමෙ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
4000-1003-07-02	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගාස්තු	7,040	7,040	8,484	120.5%
4000-1003-07-03	දැව ප්‍රවාහනය පෞද්ගලික	-	-	47	-
4000-1003-07-05	වෙඩි බෙහෙත් බලපත්‍ර	80	80	133	167.25%
4000-1003-07-99	වෙනත් බලපත්‍ර මත වන ගාස්තු	150	150	92	61.92%
4000-2002-01-01	රජයේ ගොඩනැගිලි කුලී	3,150	3,150	3,558	112.97%
4000-2002-01-02	රජයේ කැලෑවලින් ලැබෙන ආදායම	-	-	4,121	
4000-2002-02-99	වෙනත් කටයුතු මත වන පොළිය	2,300	2,300	2,533	110.15%
4000-2003-02-13	විභාග හා අනෙකුත් ගාස්තු			209	
4000-2003-02-14	මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරනු ලබන ගාස්තු ලැබීම			30,104	
4000-2003-02-99	පොදු සම්පාදක ක්‍රියාවලියේ ගාස්තු අය කිරිම	1,000	1,000	1,440	144.06%
4000-2003-99-00	අනෙකුත් ලැබිම්	3,000	3,000	2,779	92.65%
4000-2004-01-00	සමාජ ආරක්ෂණ දායකත්වය			12,218	

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		කත්‍ය වියදම්	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	215,000	229,300	226,240	98.66%
ප්‍රාග්ධන	54,000	55,350	38,129	68.88%

3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට වියදම් සඳහා වන ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		කත්‍ය වියදම්	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ජනාධිපති කාර්යාලය	ග්‍රාම ශක්ති	66,830	66,830	39,773	59.51%
2		වකුගඩු රෝග වැඩසටහන්	2,197	2,197	1,928	87.76%
3		ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන්	5	5	5	100%
4		ජාතික උත්සව	89	89	55	62.64%
5		දරුවන් සුරකිමු ජාතික වැඩසටහන	399	399	350	87.86%
6		විහාර ආදිය ඉදිකිරීම	2,000	2,000	20	10.00%
7		ස්මාර්ට් ශ්‍රී ලංකා	5,525	5.525	1,511	27.35%
8	බුද්ධශාසන අමාත්‍යාංශය	විහාර ආදිය ඉදිකිරීම	2,437	2,437	175	7.21%
9	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික	පුහුණු උපාධිධාරී දීමනා	29,280	29,280	21,158	72.26%
10		ඩී.සී.බී	29,503	29,503	12,083	40.95%

11	කටයුතු අමාත්‍යාංශය	ඩබ්.එෆ්.පී	125	125	124	99.78%
12		ආර්.අයි.ඩී.පී	100,389	100,389	41,779	41.61%
13		ගම්පෙරලිය	408,250	408.250	349,299	85.56%
14		කුඩා ව්‍යාපාර අංශය	3,890	3,890	3,752	96.46%
15	අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය		4,074	4,074	3,856	94.65%
16	කෘෂිකර්ම අමාත්‍යාංශය	වී	200,000	129,665	129,665	100%
17			16,800	16,800	14,770	87.91%
18	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය	ගර්භනී මව්වරු සඳහා පෝෂණීය ආහාර මල්ලක් ලබා දීම	52,000	52,000	51,216	98.49%
19			4,244	4,244	4,005	94.37%
20	ජනමාධ්‍ය අමාත්‍යාංශය		43	43	36	83.44%
21	ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	ඉඩම් ප්‍රධානය	809	809	783	96.89%
22			2,325	2,325	2,037	87.63%
23	ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය	වකුගඩු	78,902	78,902	78,820	99.89%
24		විශේෂ ආබාධිත සහිත	67,822	67,822	67,548	99.59%
25		වැඩිහිටි	53,489	53,489	53,014	99.11%
26		වයස අවුරුදු 100 වැඩි	240	240	195	81.25%
27	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය	හදිසි සහනාධාර	2,199	2,199	1,396	63.50%
28		පුනරුත්ථාපන ආරක්ෂක මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය	2,024	2,024	2,024	100.00%
29		ගංවතුර ආපදාව අවම කිරීම	6,691	6,691	1,672	24.99%
30			2,282	2,282	2,090	91.60%
31	කර්මාන්ත හා වාණිජ කටයුතු,	TER නිවාස යෝජනා	556,000	556,000	341,011	61.33%

	දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘතිය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය	ක්‍රමය				
32		IDPS	30,800	30,800	26,455	79.40%
33		නංවමු ශ්‍රී ලංකා	113,000	113,000	178	0.15%
34	අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යශය		387	387	324	83.62%
35	ජාතික ඒකාබද්ධතා,රාජ්‍ය භාෂා, සමාජ ප්‍රවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය	සංවර්ධන ව්‍යාපෘති	14,161	14,161	6,233	44.01%
36		ONUR	68,348	68,348	13,221	10.58%
37			1,317	1,317	1,260	95.72%
38	මහා නගර බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	සුකිද පුරවර	5,000	5,000	1,279	25.59%
39	විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය		5,723	5,723	5,413	94.60%
40	විද්‍යා තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශය		584	584	419	71.90%
41	බෞද්ධ කටයුතු පිළිබද දෙපාර්තමේන්තුව	දහම් පාසැල් වැඩසටහන්	9,089	9,089	8,883	97,73%
42			1,112	1,112	1,070	96.19%
43	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	සංවර්ධන කටයුතු	450	450	440	97.99%
44			9	9	9	100%
45	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	දේවස්ථාන ඉදිකිරීම් කටයුතු	1,200	1,200	1,026	85.54%
46		නල ලිං ඉදිකිරීම	566	566	563	99.49%
47	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව		854	854	667	78.16%
48	රාජ්‍ය තොරතුරු දෙපාර්තමේන්තුව		123	123	177	95.41%
49	සමාජ සේවා දෙපාර්තමේන්තුව		2,860	2,860	2,481	86.74%
50	පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව		3,540	3,540	3,202	90.44%

51	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	ක්‍රීඩා පිට්ටනි ප්‍රතිසංස්කරණය	8,000	8,000	7,900	98.75%
52			271	271	-	0%
53	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව		256	256	192	74.82%
54	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව		6,315	6,315	6,233	98.69%
55	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව		1,337	1,337	1,228	91.84%
56	රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව	රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු ගෙවීම්	485	485	475	97.87%
57	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	වන ජීවී හානි	78	78	78	100%
58	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	ගොඩනැගිලි ඉදිකිරීම	1,497	1,497	-	0%
59			805	805	719	89.35%
60	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව		1	1	-	0%
61	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව		539	539	530	98.37%
62	මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව		460	460	379	82.41%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්තව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	657,603	657,603		
9152	යන්ත්‍රෝපකරණ	159,175	159,175		
9153	ඉඩම්	751,818	751,818		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ	10,457	10,457		
9180	බදු දෙන ලද වත්කම්				

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	NNP/VN/A/DSV/02/19	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2020 මැයි 30 දින

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
වවුනියාව

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම

2

ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉකුත් වර්ෂයට අදාල වටිනාකම්ද ඇතුළත් කර ඇත. මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

3

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.6.2.(iv)	සමාලෝචිත වර්ෂය තුළ භෞතික වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු රු. 165,490 ක මුදල් ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	භෞතික වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතුය.
1.6.2.අ.(i)	රජයේ නිලධාරීන්ට ණය අත්තිකාරම් ලබා දීම මඟින් සමාලෝචිත වර්ෂය තුළ ලබා ගෙන තිබුණු රු. 2,495,280 ක පොලී මුදල්, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.	රජයේ නිලධාරීන්ට ණය අත්තිකාරම් ලබා දීම මඟින් ලද පොලී මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම් ගත කළ යුතුය.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍යතත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ අගය රු. 1,579,055,053 ක් ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම අගය රු. 1,576,746,739 ක් පමණක් වූයෙන් එම අගයන් දෙක අතර රු. 2,308,314 ක වෙනසක් නිරීක්ෂණය විය.

4

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.2.1 ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ භෞතික වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු රු. 166,450 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු. 2,533,523 ක පොලී මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

5

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.1 ඡේදය	-	ආයතන ප්‍රධානීන් ඇතුලුව සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවත්, වවුනියා දිස්ත්‍රික් ලේකම්වරයා කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සටහන් නොකරන බව නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යය සාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලන හා මානව සම්පත් කළමණාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

ඒ.ජේ.එල්.විමලරත්න
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

6

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
ජීවනාධාර සහන වැඩපිලිවෙල ලබා දුන් පවුල් සංඛ්‍යාව		√	
ග්‍රාම ශක්ති හා සමෘද්ධි වැඩ සටහන් යටතේ ආදායම් ප්‍රතිපාදන ව්‍යාපෘතීන් ආරම්භ කිරීම සඳහා සක්‍රීය ලෙස ණය පහසුකම් ලබා දුන් පවුල් සංඛ්‍යාව		√	
කුඩා හා මධ්‍ය පරිමානයේ ආයතනයක් සථාපිත කිරීම			√
ලබා දීමට ඇති නිවාස සහන			√
සමෘද්ධි දීමනා වැඩ සටහන් යටතේ අන්තර් ගත කල කල පවුල් සංඛ්‍යාව		√	
ගෙවතු වගා කිරීම		√	
වී වගා කිරීම			√
ධාන්‍ය වර්ග නිෂ්පාදනය			√
එළවළු වර්ග නිෂ්පාදනය			√
කිරි නිෂ්පාදනය			√
ආහාර සඳහා මස් නිෂ්පාදනය		√	
බිත්තර නිෂ්පාදනය			√
වැව් ප්‍රතිසංස්කරණය			√
කෘෂි ළිං ඉදිකිරීම			√
සෞඛ්‍ය ආයතන සඳහා වන නව ගොඩනැගිලි ඉදිකිරීම			√
සෞඛ්‍ය මධ්‍යස්ථාන පහසුකම් ප්‍රවර්ධනය කිරීම			√
නව ගිලන් රථ සේවයේ යෙදවීම			√
ඩෙංගු රෝග පාලනය		√	
පංති කාමර ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත් වැඩියා කිරීම			√
විද්‍යාගාර ගොඩනැගිලි ඉදි කිරීම		√	
කාර්යක්ෂම පංති කාමර ඉදිකිරීම සහ අළුත් වැඩියා කිරීම			√
ගුරුවරුන් සඳහා පුහුණු පැවැත්වීම			√
පෙර පාසල් ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම			√

ඉදිකිරීමට යෝජිත නොමිලේ නල ජල සම්බන්ධතා		√	
අළුත් වැඩියා කිරීමට යෝජිත විවෘත ළිං			√
ඉදිකිරීමට යෝජිත නල ළිං			√
ස්ථාපිත කිරීමට යෝජිත සමාජ ජල පද්ධතියන්			√
ස්ථාපිත කිරීමට යෝජිත ජල පිරිපහදු කිරීමේ සංවිධාන			√
නොමිලේ ලබා දීමට යෝජිත විදුලි බල සම්බන්ධතාවය			√
අළුත් වැඩියා කිරීමට යෝජිත ග්‍රාමීය මාර්ග			√
පුනරුත්තාපනය කිරීමට යෝජිත ආගමික සිද්ධස්ථාන		√	
ස්ථාපිත කිරිමට යෝජිත ළමා උද්‍යාන			√
අළුත් වැඩියා කිරීමට යෝජිත ක්‍රීඩාපිටි		√	
වී වගා නිෂ්පාදනය			√
ධාන්‍ය වර්ග නිෂපාදනය			√
එළවළු නිෂ්පාදනය			√
කිරි නිෂ්පාදනය			√
බිත්තර නිෂ්පාදනය		√	
මස් නිෂ්පාදනය			√

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	සාධන මට්ටම	මේ දක්වා ලඟා කරගත් සංවිධාන මට්ටමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
01 දිළිඳු භාවයෙන් මිදීම.	ජීවනාධාර සහන	පවුල් 1337 කට ජීවනාධාර ලබා දීමට කටයුතු කරන ලදි.		√	
	මූලධන රැස් කිරීම්	පවුල් 724 ක ග්‍රාම ශක්ති හා සමෘද්ධි වැඩ සටහන් හරහා ආදායම් උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම. සක්‍රිය ණය සහන ලබා දී ඇත			√
	ආයතන ප්‍රවර්ධන	කුඩා හා මධ්‍ය පරිමානයේ ආයතන 32 ක් ස්ථාපනය කිරීම.		√	
	ආරක්ෂිත වාසස්ථාන	පවුල් 1585 නිවාස සහන ලබා දී ඇත		√	
02 දිළිඳුකම පිටු දැකීම	සහන වැඩ සටහන්	පවුල් 23837 සමෘද්ධි දීමනා වැඩ සටහන් යටතේ අන්තර්ගත කර ඇත .			√
	සැමට ආහාර	ගෙවතු ස්ථාපනය කරන ලදි			√
	ආහාර නිෂ්පාදන ප්‍රවර්ධන කිරීම	වී නිෂ්පාදනය		√	
		ධාන්‍ය නිෂ්පාදනය		√	
		එළවළු නිෂ්පාදනය		√	
03. ආහාර නිෂ්පාදන වර්ධන කිරීම	කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය	දිනකට 33880 කිරි නිෂ්පාදනය		√	
		දිනකට මස් 6,793Kg නිෂ්පාදනය		√	
		දිනකට බිත්තර 25,021 ක් නිෂ්පාදනය			√
		වැව් 19 ක් ප්‍රතිසංස්කරණය කිරීම		√	
		කෘෂි ළිං 36 ක්ඉදිකිරීම		√	

04 සුව දිවියක් ගත කිරීම උදෙසා	වැඩි දියුණු කළ සෞඛ්‍ය මධ්‍යස්ථාන	නව ගොඩනැගිලි 4 සෞඛ්‍ය ආයතන සඳහා ඉදිකිරීම		√	
	වැඩි දියුණු කළ සෞඛ්‍ය මධ්‍යස්ථාන	සෞඛ්‍ය මධ්‍යස්ථාන 6 පහසුකම් ප්‍රවර්ධනය කිරීම		√	
	වැඩි දියුණු කළ සෞඛ්‍ය මධ්‍යස්ථාන	නව ගිලන්රථ 2 සේවා සම්බන්ධ කිරීම		√	
	වැඩි දියුණු කළ සෞඛ්‍ය මධ්‍යස්ථාන	ඩෙංගු රෝග පාලනය		√	
05. ගුණාත්මක අධ්‍යාපනය	ප්‍රවර්ධනය කල අධ්‍යාපන පහසුකම්	පංති කාමර 20 ක් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය		√	
	ප්‍රවර්ධනය කල අධ්‍යාපන පහසුකම්	විද්‍යාගාර ගොඩනැගිලි 02ක් ඉදිකිරීම		√	
	කාර්යක්ෂම ඉගෙනුම් ක්‍රම	කාර්යක්ෂම පංති කාමර 08 ක් ඉදිකිරීම හා අළුත් වැඩියාව		√	
	ගුණාත්මක යෙදවුම්	ගුරුවරු 24 දෙනෙකු සඳහා පුහුණුව ලබා දීම.		√	
	සැමට අධ්‍යාපනය	පෙර පාසල් 10 ක් ඉදි කිරීම හා අළුත් වැඩියාව			√
06 පිරිසිදු පානීය ජලය හා සෞඛ්‍ය	පිරිසිදු පානීය ජලය	නළ ජල සම්බන්ධතා 230 ක් ලබා දීම		√	
	ප්‍රමාණවත් ජල මූලාශ්‍ර	විවෘත ළිං 44 ක් අළුත් වැඩියා කිරීම		√	
		නල ළිං 28 ක් ඉදිකිරීම		√	
	ප්‍රමාණවත් ජල මූලාශ්‍ර	විවෘත ළිං 06 ක් අළුත් වැඩියා කිරීම		√	
	ප්‍රතිශක්ති කරන පිරිසිදු පානීය ජලය	ජල ප්‍රතිශක්ති කරන සංවිධාන ස්ථාපිත කිරීම		√	
		සමාජ ජල ව්‍යාපෘති 21 ක් ස්ථාපිත කිරිම			√
07.අඩු වියදමෙන් බලය	සියලු දෙනාට විදුලිය ලබා දීම	නොමිලේ විදුලි සම්බන්ධතා 221 ලබා දිම		√	
08රැකියා අංශයේ නව්‍යකරන යටිතල	පහසුවෙන් ප්‍රවේශ වීම	230.4Km ග්‍රාමීය මාර්ග අළුත් වැඩියා කිරිම			√

පහසුකම්					
09.තිරසාර නගර හා සමාජ	ස්ථිර විසඳුම්	ආගමික සිද්ධස්ථාන 366 ප්‍රතිසංස්කරණය කිරීම		√	
	ප්‍රවර්ධනය කල ප්‍රතිසංස්කරණ	32 ක් ළමා උද්‍යාන ඉදිකිරීම		√	
	ප්‍රවර්ධනය කල ප්‍රතිසංස්කරණ	ක්‍රීඩාපිට්ටනි 158 ක් අළුත් වැඩියා කිරීම		√	
10. සාමාන්‍ය පරිභෝජන නිෂ්පාදනය	නිෂ්පාදනය වැඩි කිරීම	වී මැ.ටො77,646 නිෂ්පාදනය		√	
	නිෂ්පාදනය වැඩි කිරීම	ධාන්‍ය මැ.ටො 9,736 ක් නිෂ්පාදනය		√	
	නිෂ්පාදනය වැඩි කිරීම	එළවළු මැ.ටො 13,574 ක් නිෂ්පාදනය		√	
	නිෂ්පාදනය වැඩි කිරීම	දිනකට 33,880 කිරි නිෂ්පාදනය		√	
	නිෂ්පාදනය වැඩි කිරීම	දිනකට 25.021බිත්තර නිෂ්පාදනය			√
	නිෂ්පාදනය වැඩි කිරීම	දිනකට 6.793Kg මස් නිෂ්පාදනය		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ඇති අභියෝග .

1.දිළිඳුකම පිටු දැකීම

සැලකිය යුතු පවුල් සංඛ්‍යාවක් නව ආදායම් ප්‍රවර්ධනය කළ අතර පවුල් 1585 ප්‍රමිතියකින් යුතු නිවාස පහසුකම් ලබා ගත්හ.තවද අවශ්‍යතා හඳුනා ගැනීමත් සමග මූල්‍ය ප්‍රභවයන් හඳුනා ගැනීමේ අවශ්‍යතාවයක් පවතී.

2. සාගින්න පිටු දැකීම.

ඉතාමත් දිළිඳු පවුල් 23,837 සමෘද්ධි සහනාධාර වැඩ සටහන් යටතේ ඇතුලත් කර ඇත. තවත් පවුල් බොහෝමයක් සම්බන්ධ කර ගැනිමට යෝග්‍ය සුදුසුකම් ලබා සිටි.එනමුත් සාගින්න ආහාර නොමැතිකම යනු අපේ ප්‍රදේශයේ ඉතාමත් අඩු අගයක් ගනි.පසුගිය වර්ෂ වල ආහාර නිෂ්පාදනය ගංවතුර , නියඟය ආදී ස්වභාවික විපත් වලට මුහුණ දීමට සිදුවිය.ආහාර ප්‍රවර්ධනය අතිශයින්මවැදගත් කාරණාවක් බවට දැනට හඳුනා ගෙන ඇත. ආහාර නිෂ්පාදන ධාරිතාව ප්‍රවර්ධනය කිරීමට හා ඵලදායිතාවය ඉහල නැංවීමට වාරිමාර්ග පහසුකම් ප්‍රවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය කරුණක් බව හඳුනාගෙන ඇත.

3.ඉහල සෞඛ්‍ය ආරක්ෂාවක් හා සුවබර ජීවිතයක්

නවීන සෞඛ්‍ය පහසුකම් වල අවශ්‍යතාවය දැඩිව අවශ්‍යව ඇත. ග්‍රාමීය සෞඛ්‍ය පහසුකම් නවීකරණය කළ යුතුවේ.සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල සේවක ඌනතාවය කඩිනමින් සම්පූර්ණ කළ යුතුවේ.

4. ගුණාත්මක අධ්‍යාපනය

නගරාසන්න පාසල් වල කාර්‍ය සාධන මට්ටම් සතුටුදායක මට්ටමක පැවතුනද ග්‍රාමීය ප්‍රදේශ වල පාසල් කාර්‍ය සාධන ප්‍රශස්ථ මට්ටමකට ලගා වී නොමැත. තෝරා ගත් විෂයන් සඳහා ග්‍රාමීය පාසල් වල අවශය ගුරුවරුන්ගේ ඌනතාවය විශාල ගැටළුවකි.

6.පිරිසිදු ජලය හා සෞඛ්‍යය

නගරාසන්න ප්‍රදේශ වල නළ ජල බෙදා හැරීම සිදු වන අතර මේ සඳහා නව ජල මූලාශ්‍ර හඳුනා ගෙන සංවර්ධනය කර ඇත.(පේරාරු ව්‍යාපෘතිය)ග්‍රාමීය ප්‍රදේශ වල ජල හිගයක් පවති .ග්‍රාමීය ජල යෝජනා ක්‍රම සමාජ ජල යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම මගින් මෙම ගැටළුවට විසඳුම් සෙවිය හැකිය.තවද භූගත ජලයේ ප්‍රමිතිය ඇතැම් ප්‍රදේශයන්හි දී යෝග්‍ය නොමැති අතර බීමටද යෝග්‍ය නොවන බැවින් දැඩි ලෙස වකුගඩු රෝගාබාධ වලට ගොදුරු වේ .තවද අවදානම් බහුල වේ .මේ හේතුවෙන් මෙම දිස්ත්‍රික්ක ජාතික වකුගඩු රෝග නිවාරණ ව්‍යාපෘති යටතේ අන්තර් ගත කර ඇත.

7. බලශක්ති

සියළුම පවුල් ඒකක ජාතික විදුලි බල පද්ධතිය සමග සම්බන්ධ කර ඇත.තවද සූර්ය බල ශක්ති නිෂ්පාදනයට ප්‍රමාණවත් අවස්ථාවක් ප්‍රදේශයේ දක්නට ලැබීම හේතුවෙන් පෞද්ගලික අංශයේ දායකත්වය හා ආයෝජනය අපේක්ෂා කෙරේ.

9.කර්මාන්ත නවෝත්පාදනය හා යටිතල පහසුකම්

මාර්ග හා පාලම් යටිතල පහසුකම් සංවර්ධනය කිරිමේ අවශ්‍යතාවය විශාල වශයෙන් පවතී.වාර්ශිකව ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය මෙම ගැටළුවට සම්මිශ්‍රණ ස්ථාවර හා ප්‍රමාණවත් විසඳුමක් ලබා දීම තරම් ප්‍රමාණවත් නොවේ. තවදුරටත් I Road Project 2019 ආරම්භ කළ බවට දක්වා තිබුණද මෙම යෝජනාව 2020 වර්ෂයට කල් දමා ඇත.මෙම ව්‍යාපෘතිය යටතේ 271.5 Km දිග මාර්ගය කාපට් යෙදීමට තිරණය කර ඇත.

11.<u>තිරසාර නගර හා සමාජ</u>

මාර්ග ජාලවල හා ජල ප්‍රවාහන පද්ධතීන් වල සංවර්ධනය කෙරෙහි අවධාය යොමු කළ යුතුවේ.වවුනියා මහ රෝහලේ සංවර්ධනය කිරිම සදහා අවශ්‍ය ප්‍රමාණවත් ඉඩම් නොතිබීම දැනට පොදු ගැටළුවක් බවට නිර්මානය වී ඇත.ඉදිකරන ලද ආර්ථික කේන්ද්‍රස්ථානය හා ජාතික ක්‍රීඩාංගනය සංස්කෘතික මධ්‍යස්ථානය යනාදීන් මහජන උපයෝගිතාවය සඳහා ජනතාව සතු කළ යුතුවේ.

12.<u>පරිභොජනය හා නිෂ්පාදනය</u>

නව තාක්ෂණික ශිල්ප ක්‍රම උපයෝගි කිරිමෙන් කෘෂි නිෂ්පාදනය වර්ධනය වේ .වාරිමාර්ග යෝජනා ක්‍රම ඇල මාර්ග සංවර්ධනය කිරිම් ආදිය කෙරෙහි ආවධානය යොමු කළ යුතුවේ.

ශ්‍රී ලංකා රජය තම රටේ ජනතාවගේ ආර්ථික සමාජ සංවර්ධනය ඉලක්ක කරමින් විවිධ වූ ව්‍යාපෘති 2019 වර්ෂයේදි ක්‍රියාත්මක කර තිබුණි.

i. ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය
ii. ගම්පෙරලිය සංවර්ධන යෝජනා
iii. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති
iv. විමධ්‍ය ගත අයවැය යෝජනා
v. අභ්‍යන්තර අවතැන් වුවන් සඳහා /දීර්ඝ කාලීනව අවතැව් වුවන් සඳහා වන නැවත පදිංචි කිරිමේ ව්‍යාපෘති
vi. ආර්ථික සංවර්ධන යෝජනා ක්‍රම
vii. පළාතේ නම් කල මූල්‍ය ප්‍රතිපාදන යටතේ වන සංවර්ධන යෝජනා
viii. රෙගුලාසීන් ප්‍රධානයන් යටතේ වන සංවර්ධන යෝජනා ක්‍රම

ඉහත ව්‍යාපෘතීන් දරිද්‍රතාවය ඌන සංවර්ධනයෙන් පවතින ග්‍රාමීය ජන කොට්ඨාශයේ ජීවන තත්වය ඉහත නැන්වීම අරමුණු කොට ගත් අතර තිරසාර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීමට විශාල වශයෙන් දායකත්වයක් ලබා දේ .එනමුත් මෙම සමාජ කොට්ඨාශයේ අවශ්‍යතාවයන් බහුල වුවද රටේ මූල්‍ය තත්වයන් උක්ත ඉලක්ක කෙටි කාලයක් තුල සාක්ශාත් කර ගැනීමට ප්‍රමාණවත් නොවන්නේය.එබැවින් මෙම අරමුණු ලගා කර ගැනීමට සැලකිය යුතු කාල පරිච්ඡේදයක් අවශ්‍ය වන අතර සාමකාමී වාතාවරණයක් හා ස්ථාවර රාජ්‍යක්ද අවශ්‍ය කාරණාවකි.

06 පරිච්ජේදය – මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	20	20	0
තෘතිය	20	06	14
ද්විතිය	299	225	74
ප්‍රාථමික	64	54	10

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශිය / විදේශිය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශිය	විදේශිය		
විශ්වාසනීය ප්‍රවේශ ක්‍රම අදාල පුහුණු	170	01	21			
පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව	45	01	17			
ඉඩම් පාලනය	36	02	33			
ඵලදායිතා ක්‍රම වේද	35	01	23			
ව්‍යවසායකත්වය වර්ධනය හා නායකත්ව පුහුණුව	40	02	398			
කාර්යාල ක්‍රම වේද හා කාර්යාල ක්‍රම	75	02	55			
රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	60	01	53			
ඵලදායිතා ක්‍රම ක්‍රියාත්මක කිරීම	45	02	23			
අන්තර්ජාල ප්‍රවර්ධනය කිරිම	10	02	06			
නායකත්ව පුහුණුව හා කණ්ඩායම් පුහුණුව	35	02	409			

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූලනොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	සම්බන්ධ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	සම්බන්ධ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	සම්බන්ධ නොවේ		
1.6	වෙනත්	සම්බන්ධ නොවේ		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ(CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		

2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛන (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනාති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීම	අනුකූලවේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරිමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තබීම	අනුකූලවේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පපරිච්ජේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේවිධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූලවේ		
9	වාහන කළමණාකරණය			
9.1	සංචිත වාහනය සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූලවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109,හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ		
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලවේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාස වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්ම වන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලවේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්ට වලට අනුකුල වීම	අනුකූලවේ		
12.2	හිඟහිටි ණය ශෙෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලවේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වු තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර කිරීම	අනුකූලවේ		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	ආදායම් ගිණුම්			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූලවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම			
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දි තිබෙන අතර, වෙබ් අඩවිය හරහාහෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංශා/ චෝදනා පල නිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

18	පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධනය වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූලවේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලනොවේ	නිවැරිදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.	